# අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය

## උපදෙස් පත්‍රිකාව

## ශාසනික චර්යා කුසලතා තරගය

මෙම තරගය පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික අංශ දෙක සඳහා පමණක් පැවැත්වේ. විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබද ශාසනික චර්යාවන් නිවැරදි ශාසනික පිළිවෙත් අනුව සිදුකර පෙන්විය යුතු ය.

අභිමතාර්ථ

I. ශාසනික වත් පිළිවෙත් හා සම්ප්‍රදායයන් පිළිබඳ නිවැරදි ක්‍රමවේද පුහුණු කිරීම.
II. පටිපත්ති හා පටිවේධ ශාසනය ආරක්ෂා කරගැනීම සඳහා පෙළඹවීම
III. ශාසනික ශ්‍රද්ධාව ඇති කිරීම

තරග කොන්දේසි

I. විනිශ්චය මණ්ඩලය මගින් එම මොහොතේ නියම කරනු ලබන ශාසනික චර්යාවන් විනයානුකූලව ශාසනානුලෝමික අයුරින් ඉටුකළ යුතු ය.
II. සෑම ඉදිරිපත් කිරීමක් ම ශාසනික ශ්‍රද්ධාව අඇතිවන අයුරින් ඉදිරිපත් කළ යුතු ය.
III. තරගකරුවන් හිස රැවුල් බා පත්කඩය, වටාපත ආදි අවශ්‍ය උපකරණ රැගෙන ආ යුතුය.
IV. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

තරග අංශ

I. පිණ්ඩපාතයේ වැඩමවීම
II. නව වැඳුම් වැඳීම
III. භාවනාවේ විවිධ ඉරියව්
IV. සහමහලු පිළිවෙල
V. නිවැරදි ගමන් විලාසය
VI. දානය වැළඳීමේ නිවැරදි ක්‍රම
VII. වත් පිළිවෙත් පැවැත්වීමේ ශාසනික ක්‍රම

විශේෂයි

මෙම තරගය පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් සකස් කර දීම සංවිධායක මණ්ඩලයේ වගකීම වේ.

ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | ශාසනානුලෝමික බව | 20 |
| 2. | නිවැරදි පටිපාටිය | 20 |
| 3. | අවබෝධය | 20 |
| 4. | ශ්‍රද්ධාසම්පන්න බව | 20 |
| 5. | සමස්තය | 20 |
| | මුළු ලකුණු | 100 |